# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1933/36 - 2015 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2015.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/07/2013/එච්ඩබ්/104.
*මගේ අංකය.* 4/3/1/75/3769/23.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 717 - දේශාස්ත්‍ර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, කළුතර උතුර ගමේ පිහිටි, සර්වේ ජනරාල් වෙනුවට කළුතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති මූලික පිඹුරු අංක ක:4474 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0008 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල (01) :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: බුළුගහවත්ත, වරිපනම් අංකය:- ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඩී. එස්. වීරක්කොඩි, වරිපනම් අංක 1, 3 සහ 5, කළුතර උතුර; ප්‍රමාණය: හෙක්. 0.0008.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2015 ඔක්තෝබර් මස 14 වැනි දින අනුව පෙරවරු 10.00 ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2015 ඔක්තෝබර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

විමල් ගුණතුංග
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
කළුතර.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය
කළුතර.

10 - 460

---

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : GODS/LND/05/ACQ/01.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* 4/3/6/2013/HW/366.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1883/11 හා 2014.10.10 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ මා විසින් පළ කර ඇති 7 වන වගන්තිය යටතේ වූ දැන්වීමෙහි අදාළ පිඹුරු අංක සාවද්‍ය ලෙස සඳහන්ව ඇති


1A - G 22381 - 71 (2015/09)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

බැවින් ඒ වෙනුවට මු. පි. ර. 304, අ. ග. පි. 611 අතිරේකය 2 පත්‍රය 3, අ. ග. පි. 613 අතිරේකය 14 පත්‍රය 17, අ. ග. පි. 699 අතිරේකය 12 පත්‍රය 12, අ. ග. පි. 606 අතිරේකය, 18 පත්‍රය 19 යන පිඹුරු පහ ආදේශ විය යුතු බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

තව ද උක්ත ගැසට් නිවේදනයේ සඳහන් ග්‍රාම නිලධාරී වසම් හා ඉඩම් සියල්ල පහත දැක්වෙන ආකාරයට එක් එක් පිඹුර යටතේ අදාළ විය යුතු බව වැඩි දුරටත් දන්වා සිටිමි.

1. මු. පි. ර. 304 - රක්වාන නගර වසම:
   කැබලි අංක 2 සිට 17 දක්වා ඉඩම්.

2. අ. ග. පි. 611/2/3 - වෙරළුගහමුල වසම:
   කැබලි අංක 89 සිට 335 දක්වා ඉඩම්.

3. අ. ග. පි. 613/14/17 - කොට්ටල වසම:
   කැබලි අංක 283 සිට 424 දක්වා ඉඩම්.

4. අ. ග. පි. 699/12/12 - රක්වාන උතුර වසම:
   කැබලි අංක 773 සිට 820 දක්වා ඉඩම්.

5. අ. ග. පි. 606/18/19 - මාදම්පේ උතුර, මාදම්පේ දකුණ, හොරමුල යන වසම්:
   කැබලි අංක 1653 සිට 2509 දක්වා ඉඩම්.

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
ගොඩකවෙල,

2015 සැප්තැම්බර් මස 22 වැනි දින,
ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 466

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.